# සාම්ප්‍රදායික භික්ෂු අධ්‍යාපනය හා බෞද්ධ අධ්‍යයන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

හල්පිටියේ සමිතසිරි හිමි

## හැඳින්වීම

බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය අතිශයින් ම සම්භාව්‍ය වූවකි. බුදුසසුනෙහි ශාස්තෘත්වය ඇතුළු ආචාර්ය ශිෂ්‍ය පරපුර හා ආධ්‍යාත්මික පරමාර්ථය සම්බන්ධයෙන් සමාරම්භක අවස්ථාවේ පටන් ම මෙම සම්භාව්‍ය ලක්‍ෂණ විද්‍යමාන වේ. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි ම පර්යාප්තිය හෙවත් පෙළ ඉගෙනීම, දැරීම හා භාවිතය සම්ප්‍රදායක් වූ බව පැහැදිලි වේ. බෞද්ධ භික්ෂුවගේ අධ්‍යයන කාර්ය අඛණ්ඩව පැවතෙන පරියත්ති, පටිපත්ති, පටිවේධ සහිත චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතිබද්ධ ක්‍රියාවලීන්හි සම්ප්‍රදායකි. එබැවින් ඓතිහාසික සන්දර්භය අනුව සලකා බැලුව ද මෙය භික්ෂු අධ්‍යාපනය පිළිබඳ සුවිශේෂි ලක්‍ෂණයක් වශයෙන් සැලකීම අතිශයින් සාධාරණ වේ. වෛදික පිළිවෙත් යාග හෝම මන්ත්‍ර ගීතිකා මූලිකව පැවතෙන්නා සේ බෞද්ධ භික්ෂූන්ගේ අධ්‍යාපනය විරාගය මුල්කොට පැවතෙන බව (පි.394) මුඛර්ජී. ආර්. කේ. දක්වා ඇත. බෞද්ධ අධ්‍යාපන ක්‍රමයෙහි ඉතිහාසය යනු භික්ෂු අධ්‍යාපනයෙහි ආරාමික සහ පිරිවෙන් සම්ප්‍රදායයි. භික්ෂූන්වහන්සේ ආධ්‍යාත්මික විමුක්තිය පරමාර්ථ කොටගත් සතිමත්භාවයෙන් ද ඉගෙනීම, ධර්ම සන්නිවේදනය, ඉගැන්වීම හා විනයානුකූල ශික්ෂණය මෙන් ම සිරිත් විරිත් ගරුකභාවය සහිත දිවිපැවැත්ම ද සමාජ යුතුකම් ඉටුකිරීමෙහි අරමුණෙන් ද ප්‍රොත්සාහී වූහ.

බුදුරදුන්ගේ සමීප කාලයෙහි භික්ෂූහු දේසනා, ඕවාද, පටිපුච්ඡා සහ උද්දේස ක්‍රමවේද අනුව අවබෝධයෙන් භාවිතයෙන් විශිෂ්ට වූහ. ථෙරවාදී භික්ෂූන් මහාවිහාරය දක්වා වැඩමවූයේ ද මෙම සම්ප්‍රදායෙහි ශික්ෂණයවූවන් වශයෙනි. බුදුදහම මෙරට පැමිණ ස්ථාවරව ව්‍යාප්ත වීමේ දී ද අනුගමනය කළේ ස්ථවිරවාදී, විභජ්ජවාදී පෙළෙහි පිළිවෙළ ම වේ. බුදුරදහු 'උග්ගණ්හාථ භික්ඛවේ' යනුවෙන් අනුශාසනය කළේ



වුවද එය පර්යාප්තිය වඩාත් උත්කර්ෂයෙන් උද්ග්‍රහණය කිරීමෙහිලා දුන් මග පෙන්වීමකැ'යි ස්ථවිරවාදී භික්ෂූහු නොගත්හ. එබැවින් ප්‍රතිපත්ති ගරුකභාවය උන්වහන්සේලාගේ ආධ්‍යාත්මික පරමාර්ථයෙහිලා වඩාත් උනන්දු කළේය.

නිර්වාණාවබෝධය භික්ෂුවගේ ප්‍රමුඛ පරමාර්ථය වුවත් භික්ෂුවගේ සමාජයීය කාර්යභාරය විස්තීර්ණ බැවින් කාලානුරූපව ලෞකික විෂය විෂයීය තාර්කික ඥානය, සමය සමයාන්තර ඥානය, ජ්‍යොතිෂ්‍ය, කලාව, තාරකා විද්‍යාව සහ ආයුර්වේද සහ වේද වේදාන්තාදී වූ අනේකවිධ ශබ්ද ශාස්ත්‍රයන්හි ශාස්ත්‍රඥභාවය අවැසි වූයේම ය.

භික්ෂු අධ්‍යාපනයෙහි ක්‍රමික විකාශනයෙහි 'පරිවේණ' ශබ්දය විමසත් ම එහි අරුත්ති වැට පවුරු ආදියෙන් පරික්ෂේප වූ ආවාසය හෙවත් තනි තනිව වැඩවිසීමට තැනවූ කුටිය යනුයි. පසුව ආවාසය හෙවත් තනි තනිව වැඩවිසීමට තැනවූ කුටිය යනුයි. පසුව ශාස්ත්‍රාභිලාසී භික්ෂූන්ගේ වාසය සහිත පඨන, උද්ගහණ, ධාරණ, සජ්ඣායන, වාචන, ආචික්ඛන, දේසන, පටිපුච්ඡන, විවරණ, විභජන අධ්‍යයන ක්‍රම ශිල්පයන්ගෙන් සුසංවිධිත අධ්‍යාපන නිකේතනයක් විය. එය වර්තමානයෙහි ව්‍යවහාරය අනුව භික්ෂූන්ට ඉගෙනීමට වෙන් වූ එහෙත් ගිහි පිරිමි දරුවන්ට ද ඉගෙනීමට අවසර ඇති ආයතනයකි. ඓතිහාසික මූලාශ්‍රය අනුව ලෙන්, ගිරි, ගුහා, සෙල් ලිපි සහ අභිලේඛන මගින් අනුරාධපුර මුල්යුගයේ සිට භික්ෂූන්ට විහාර ආරාම පිරිවෙන් පූජා කළ රජවරු, මැති, ඇමති, සිටුවරු හා උපාසක උපාසිකාවන් ගැන සඳහන් වේ. බුදුසසුන සමාරම්භයේ සිට ම සිව්පසයෙන් භික්ෂුව රක්ෂා කළේ ගිහි බෞද්ධයන් විසිනි. බුද්ධ කාලීන භාරතයේ මහාශ්‍රාවකයන් වහන්සේලා ඇසුරෙන් ධර්ම විනය ශික්ෂණය වූයේය. භාරතීය ආරාමීය සම්ප්‍රදායෙහි යුග යුග පරිණාමීය හේතු සාධක ප්‍රවණතා ඔස්සේ බෞද්ධ භික්ෂු අධ්‍යාපනය කලෙක උන්නතියට ද තවත් කලෙක අවනතියට ද ලක්විය. තෙවන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵලයක් ලෙස මෙරට බුදුදහම ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් මහාවිහාරය කේන්ද්‍රස්ථානය කර රුහුණුපුර ඇතුළු ප්‍රදේශවල පිරිවෙණ ආරම්භ වුණි. එකල අනුරාධපුරයෙහි පමණක් මහාවිහාරය, චෛතියගිරිය, ථූපාරාමය, ඉසුරුමුණිය හා මේඝගිරිවිහාරය පැවතුණි. මහාවිහාරය ධර්ම විනය ඇතුළු ථෙරවාද සම්ප්‍රදාය ඉගැන්වූ අධ්‍යාපන

මාතිකා හෙවත් උද්දේස අසා දරාගත් තැනැත්තා එය වචනයෙන් උච්චාරණය කරමින් නැවත නැවත පුරුදු කිරීම සිදු කරනු ලැබුවේය. වනපොත් කිරීමෙන් පසු එම මතකය තහවුරු කරගැන්ම උදෙසා සජ්ඣායනය කරන ලද්දේ ඒ සඳහා විය යුතු ය. එසේ ධාරණය කරගත් ධර්මය නුවණින් අර්ථ වශයෙන් මෙනෙහි කර බලා අර්ථය වටහා ගැන්ම හා දරා ගැන්මෙහි නිරවද්‍යතාව මෙනෙහි කර බැලීම ද යන කරුණු සිදු කර තිබේ.''[3]

ධර්ම ශ්‍රවණය මගින් බහුශ්‍රැතභාවය කරා පත් සතිසම්පජඤ්ඤයෙන් යුක්ත වූයේ ඇසූ ධර්මය දරා සිටින හෙයින් සුතධර නම් වේ. උගත් ධර්මය එක්තැන් කොට ආරක්ෂා කොට රැස්කරගන්නා සුතසන්නිචය නමින් හඳුන්වා ඇත.[4]

''ධම්මං සුත්වා අත්ථං ධාරේති අත්ථං උපපරික්ඛතො ධම්මං ඛධාපෙන්ති''[5] ධර්මය අසා දරයි. අර්ථය විමසා බලනුයේ ධර්මය අවබෝධ කරගනී. මතක ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා බුදුදහම අවදි බවකින් යුක්ත වූ බව 'ඛිප්පනිසන්ති' යන්නෙන් ගම්‍ය කෙරේ. ඉගෙනීමට කරුණු තුනක් හේතු වන බව පෙළෙහි සඳහන් වේ.

01. බහුශ්‍රැතවීම

02. ඇසීම

03. ධාරණය

ධර්මය විනය කටපාඩමින් රැකගෙන ඒම ධර්මධර පරම්පරාවේත් විනයධර පරපුරේත් වගකීමක් වූයේය. බුදුහු ධරමාන කාලයේ සිට ම ධර්ම භාණක හැකියාව අගය කෙරුණි. සෑම සූත්‍ර දේශනාවක් ම නැවත අසා ස්මෘති සම්පන්නව ධාරණය කර ගැනීමට ආනන්ද තෙරුන් යුහුසුලු විය. විනයධර උපාලි තෙරුන් ද එසේම වූහ.

## ග්‍රන්ථ ධුරය හා භික්ෂු අධ්‍යාපනය

බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයෙහි ධාරණය වූ සූත්‍ර ධර්ම පිළිබඳ පාණ්ඩිත්‍යයෙන් යුක්ත භික්ෂූහු සුත්තන්තධර හෙවත් සුත්තන්තික නමින් ගරු සම්භාවනා ලැබූහ. විනයධර යනු විනය දේශනා පිළිබඳ ප්‍රාගුණ්‍යයෙන් යුක්ත වූවාහුය. ධර්ම කථික යනු ධර්මය



දේශනා කිරීමෙහි බුහුටිකම් ඇති වියතාණෝ වෙති. ධම්මධර යනු ද යෙදේ, මාතිකාධර යනු මාතිකා පාලිය එනම්, අභිධර්මය සහ විනය දරන්නා එසේ හඳුන්වනු ලැබීය. තවද 'බහුස්සුතා ආගතාගමා' යනු ද යෙදේ.[6] මෙබඳු දක්ෂ පක්ෂකම් සහිත භික්ෂූහු එහි ආධුනික භික්ෂූන් ශික්ෂණය කළහ. ධර්මාධ්‍යයනය සම්බන්ධයෙන් මජ්ඣිමනිකායේ චංකි සූත්‍රයෙහි සතිසම්පජඤ්ඤය ප්‍රතිබද්ධ අධ්‍යාපනික සාධකයක් විවරණය වේ.

බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායෙහි සන්දර්භය විග්‍රහ වන අවස්ථාවක් ලෙස අංගුත්තරනිකායේ නාථකරණ ධර්ම විවරණයෙහි සඳහන් වේ.''බහුශ්‍රැත වෙයි. ශ්‍රැතධර වෙයි. ශ්‍රැතසන්නිචය වෙයි. අර්ථය සහිත ව්‍යඤ්ජන සහිත වූ කේවල පරිපූර්ණ වූ පරිශුද්ධ බ්‍රහ්මචර්යාව කියන ඒ දහම්හු ඇද්දත එබඳු දහම්හු මොහු විසින් බෙහෙවින් අසන ලද්දාහු දරන ලද්දාහු තෙපුලෙන් වනපොත් කරන ලද්දාහු සිතින් පුන පුනා දක්නා ලද්දාහු කරුණු සහිත අර්ථය ප්‍රඥාවෙන් අවබෝධ කරන ලද්දාහු වෙත්.''[7]

ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය නම් ග්‍රන්ථයෙහිදී එකල පැවති අධ්‍යාපන ක්‍රමය ගැඹුරින් විමසුමට ලක් කරමින් විග්‍රහයක යෙදී ඇත.[8]

එම ඉගැන්වීම් කාර්යයෙහි දී දක්නා ලැබෙන මූලික කරුණු වන්නේ;

01. භාෂිතයෙහි අර්ථය ඉගැන්වීම

02. වැසී තිබෙන අදහස මතුකර දැක්වීම

03. සැඟ වී ඇති අර්ථය හෙළිකර දැක්වීම

04. ධර්මයන් හි සැකතැන් පහදා දීම[9] යන කරුණු ය.

''ශිෂ්‍යයන් විසින් ධර්මය හැදෑරීමේ දි එහි අර්ථය නිවැරදිව උගත යුතුය. ධර්මයෙහි ගැබ්වන වැසී තිබෙන අදහස් මතුකර තේරුම් ගත යුතුය. පදයන්හි නිලීන තැන් හෙවත් සැඟ වී ඇති අර්ථය සොයා අවබෝධකර ගත යුතුය. ගැඹුරු ධර්මයෙහි සැක තැන් විමසා සැක බැහැර කර ගැනීම යන කරුණු මෙම අධ්‍යාපන ක්‍රියාවලියෙන් සිදුවෙයි.

එවැනි අතිශයින් නිරාකූල අධ්‍යාපනයක් නොලැබුණේ නම් ශිෂ්‍යයාට ධර්මය විනය පැහැදිලි ව නිවැරදි ව වටහාගන්නට නොහැකි වේ.''[10]

සංගායනාවෙන් පසු ශිෂ්‍ය අනුශිෂ්‍ය පරපුරට වණපොත් කොට මතකය විමසමින් පරීක්ෂා කර බලමින් ක්‍රියාකිරීමට පැවරූහ. භාණක සම්ප්‍රදායේ ආරම්භය මෙයයි.

තමන්ගේ ජීවිතය පවා නොතකා ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කළයුතු ය'යි සනිටුහන් කොට දකුණු මලය රටට ගිය භික්ෂූන් සැට නම දඹදිව සිට පෙරළා පැමිණි භික්ෂූන් ගැන අසා ඔවුන් සොයා ගොස් ඔවුනොවුන් කටපාඩමින් දැනසිටි පරිදි ත්‍රිපිටකය සන්සන්දනය කොට බැලිණි. ඒ දෙපක්ෂයේ ම කටපාඩම පදයක් පදයක් පාසා සමානව පැවතියයි කියනු ලැබේ.[11]

මනෝරථපූරණියේ සඳහන් වන පරිදි දුර්භික්ෂය අවසන් වීමෙන් පසු විදේශ ගතව සිටි භික්ෂූහු මෙරටට පැමිණි පසු ප්‍රතිපත්තියට වඩා පර්යාප්තිය වැදගත් යන්න ගැන කතිකාවතක් ඇති විය.'පරියත්ති නු ඛො සාසනස්ස මූලං උදාහු පටිපත්ති.' මෙම පරිහානිදායක යුගයේ ත්‍රිපිටකය ආරක්ෂා කිරීම අවශ්‍යතාව ප්‍රමුඛව වූ හෙයින් ප්‍රතිපත්තියට වඩා පර්යාප්තියට යොමු විය. සිල්වතෙකු වීමට වඩා උගතෙකුවීම ගැන වඩාත් අවධානය යොමුකළ බව පෙනේ.

මුලදි ග්‍රන්ථ ධුරයෙන් අදහස් කරන ලද්දේ ත්‍රිපිටක ධර්මය හා ඉගැන්වීම් පමණකි. එහෙත් කල් යත්ම භාෂා ශාස්ත්‍ර, ඉතිහාසය, රාජනීති ආදි සියල්ලත් ග්‍රන්ථ ධුරයට ඇතුළත් විය. එහෙයින් භික්ෂූහු ඒ සියල්ල ඉතා උසස් ලෙස ඉගෙන රටවැසියාට උගන්වන්නට පටන් ගත්හ.[12]

''මහණෙනි භික්ෂුව සැදැහයෙන් යුක්ත සිල්වත් වූයේ බහුශ්‍රැත වූයේ එම අංශයන්ගෙන් ඒ භික්ෂුව පිරිපුන් වන්නේය.'' මෙයින් භික්ෂුව සතු ගැඹුරු වූ අවබෝධයත් සතිමත්භාවයත් පිළිබඳ වූ යථා තත්ත්වයත් අනාවරණය කෙරේ. අධ්‍යාපනය පිළිබඳ අධිකාරය ද වගකීම ද විශේෂඥතාවය සහ දැනුම අනාගතය සංරක්ෂණය කළේ ද භික්ෂූන් විසිනි.



එකල බුදුදහම ලේඛනකරණයෙහි කිසිදු අවස්ථාවක් නොපැවතුණි. එබැවින් බුදුදහම අන්තර්ගත වූ ධර්ම විනය වනපොත් කිරීම සිදුවිය. භික්ෂූන්ට ධාරණය මගින් ධර්ම විනය මතකයේ තබා ගැනීමේ වගකීම පැවරුණි. එම කාර්ය ග්‍රන්ථ ධුරය පිරූ භික්ෂූන්ගේ ප්‍රමුඛ වගකීමක් කොට සැලකුණි. එහෙයින් ධර්ම භාණකවරු (සුත්ත) විනය භාණකවරු වශයෙන් ධර්මවිනය වෙන් වෙන්ව වාචෝද්ගත කිරීම්, ඉගෙනීම, ඉගැන්වීම, සජ්ඣායන සිදු කෙරුණි. ග්‍රන්ථ ධුරය පසු කලෙක 'පොරාණා' සහ 'භාණක' නමින් ගුරුකුල ලෙස සංවර්ධනය වූ බව සමන්තපාසාදිකා විනයට්ඨකතාවේ සඳහන් වේ. මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් පසුව ද මෙම සම්ප්‍රදාය ලංකාවේ ද ක්‍රියාත්මක වූයේය. ශ්‍රී ලාංකික භාණකවරුන් අතර අතිවිශිෂ්ට මතකයක් පැවති ආචාර්යවරු වූහ. දීඝ භාණකාදි නිකාය ග්‍රන්ථයන්හි හසල දැනුමැ'ති කුශාග්‍ර බුද්ධිමත් භික්ෂුවරු සිටියහ. රුහුණේ තිස්සමහාරාමයේ විසූ ගාමාන්තර පබ්බතවාසී මහාසිව තෙරුන් ශිෂ්‍ය ගණ අටළොසකට ත්‍රිපිටකය පෙළ, අර්ථ වශයෙන් ඉගැන් වූ බව මනෝරථපූරණී නම් ග්‍රන්ථයෙහි සඳහන් වේ. මහාවිහාරයෙහි ත්‍රිපිටකය පිළිබඳ ප්‍රධාන ආචාර්යවරයා ලෙස කලක් චූලනාග තෙරුන් ප්‍රකට වූයේය. විනයෙහි හසල දැනුමැ'ති ත්‍රිපිටකධාරී චූලාභය තෙරුන් ප්‍රධාන වගකීමක් දැරිය. විනයධර උපතිස්ස හා ධම්මධර ධම්මරක්ඛිත යන තෙරවරුන් ගුරුවරු ලෙස ඉගැන්වීම් කළහ. ආචාර්යවරු මෙන්ම ශිෂ්‍යයෝද එම මග අනුගමනය කළහ. සමකාලීනව මහාවිහාරයේ විසූ මහාසුම්ම, මහාපදුම, නම් විනය හැදෑරූ දක්ෂ ශිෂ්‍ය දෙනමක් පිළිබඳව දැක්වේ. මහාවිහාරය සහ තදනන්තර ආයතනවල උද්යෝගයෙන් යුත්තව ධර්ම විනය හැදෑරීය. ඊට සමගාමීව විදර්ශනා ධුර දැරූ භික්ෂූහුද සිටියහ. විශේෂඥ ආචාර්යවරු (අභිධර්ම විශාරද) ලෙස ප්‍රකට වූ භික්ෂුවරයෝද වූහ. පරපුරෙන් පරපුරට ග්‍රන්ථධූරීන භික්ෂූහු ධාරණය මගින් ත්‍රිපිටකය සංරක්ෂණය කළහ. මෙම අධ්‍යයන කාර්යන්ට සම්බන්ධ භික්ෂූන්ට මහජන ප්‍රසාදය ද රජවරුන්ගේ ගෞරවය හා වැටුප් ගෙවීම් වශයෙන් ඇගයීමක් ද සිදු කෙරුණ බව සෙල්ලිපි ආදියෙහි වාර්තා වේ. විසුද්ධි මාර්ගයෙහි විස්තර කෙරෙන පරිදිත 'ග්‍රන්ථ ධුරය නම් නිතර බණ දහම් ඉගෙනීමෙහි යෙදීමය. තුන් පිටකයට අයත් පොත් නිතර කට පාඩම් කිරීම, සාමූහික ව එකට කීම, එහි අර්ථය පුරුදු කර ගැනීම, නොතේරුණ තැන් ගුරුවරයාගෙන් ඇසීම ආදි වශයෙන් නිරන්තර ඉගෙනීමෙහි යෙදීම වේ.'

**භාණක පරපුර හා ධාරණ ක්‍රමවේදය**

බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයේ දීම ධර්ම විනය ශාස්ත්‍රීය වශයෙන් පර්යාප්ති අධ්‍යයනයේ අවශ්‍යතාව මතු වුණි. බුදුහු දේශිත ධර්ම ප්‍රතිපදාව සාවද්‍ය ලෙස අර්ථකථනය කරන භික්ෂූන් සිටීම එයට එක් හේතුවකි. මෙමගින් ධර්මය පිළිබඳ මිත්‍යා අදහස්, විකෘති වීම් සිදුවිය. අරිට්ඨ භික්ෂුව විසින් බුදුරදුන් වදාළ අසේවනීය සේවනයේ වරදක් නැතැයි දැක්වීම එක් අවස්ථාවකි. එසේම සාති භික්ෂුව විඤ්ඤාණය සංසරණය වෙතැ'යි පැවසීම තවත් අවස්ථාවකි. යමක භික්ෂුව ද උච්ඡේදවාදි අදහස් පැවසීය. පරිනිර්වාණ අවස්ථාවේ දී පවා බුදුරදුන් ධර්මය ශාස්තෘත් වන බව දේශනා කිරීමෙන් ධර්ම විනය සිහිතබා ගැනීමේ වැදගත්කම අවධාරණය කර ඇත. ධර්ම සේනාධිපති සැරියුත් මහතෙරුන් නිගණ්ඨනාථ පුත්තගේ අභාවයත් සමගම එතුමන් දෙසූ ධර්මය පිළිබඳ මතවාද හා එය විනාශ වන බව දැක දුරදක්නා නුවණින් ධර්මයෙහි මූලික මාතෘකා ක්‍රමානුකූලව සකස් කොට දසුත්තර හා සංගීති සූත්‍රය නමින් මැඳුම් සගියේ අවසානයට එකතු කළහ. අභිධර්මයේ ආරම්භක ස්වරූපය වූ මාතිකා මෙමගින් ලැබූ ආභාසයෙන් පහළ වූ බව සිතිය හැකිය. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක ශ්‍රාවිකා වූ භික්ෂු භික්ෂුණී උපාසිකා උපාසිකා සිව්වණක් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, විනයධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න, අනුධම්මචාරී පිරිසක් බවට පත්ව තම ගුරුන් වෙතින් මනාව ඉගෙන කියාපෑම, දේශනා කිරීම, හෙළිකිරීම, ඔප්පුකිරීම, විවරණය කිරීම, විභජනය කිරීම, පැහැදිලි කර දීම මගින් පරවාද ධර්ම විනයානුකූලව නිග්‍රහ කරමින් ධර්මය දේශනා කරන්නේ යැ'යි අගයයි.[13]

තමන් වහන්සේලාගේ ධාරණයෙහි පැවති අසූහාර දහසක් ධර්මස්කන්ධයෙන් දෙදහසක් උගත්තේ ශ්‍රාවකයන් වෙතිනැ'යි අනඳ හිමියන් ප්‍රකාශ කළ බව අටුවා ග්‍රන්ථවල සඳහන් වේ.

විනය කරුණු මුලින් පැවතියේ මාතෘකා පාඨ වශයෙන් විය හැකිය. මාතිකාධර යන්නෙන් අභිධර්ම මාතෘකා දරා සිටි අය පමණක් නොව විනය මාතෘකා දරා සිටි අයද වාච්‍ය වෙයි. විනය කරුණු පිළිබඳ විශේෂඥයෝ පැරණි සූත්‍රයන්හි හඳුන්වා ඇත්තේ විනයධරා යන විශේෂණ පදයෙනි.



තවද මෙම සංගීතියෙන් පසුව ඒ ඒ ධර්ම කොට්ඨාස ආරක්ෂා කිරීමටත් ධාරණ උද්ග්‍රහණාදියටත් උපාලි ආනන්ද අනුරුද්ධාදි භික්ෂු පරම්පරාවලට භාර කිරීම නිසා ධර්මය නොනැසී ආරක්ෂාවීයැ'යි එක් අතකින් කීමට පුළුවන්කම ඇත. එයින් ද අපේක්ෂිත පරමාර්ථයට වඩා වෙනස් ප්‍රතිඵල ලැබුනේයැ'යි කිව හැකිය. බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේගේ නියමනයන් අනුව සලකතොත් යථෝක්ත ධර්ම විනයධාරී ආචාර්ය පරම්පරාවන් පසුකාලයේ දී අටළොස් භාණකයන් බවට පත් වී ඔවුන් ධර්මය පිළිබඳ විවිධ අදහස් පළකිරීම නිසා ධර්ම විනය විවිධ මතභේද පහළ වීම ආරම්භ විය.

ප්‍රථම ධර්ම සංගීතිය භාණකවරුන් වෙත පැවරුණ වගකීම බැරුරුම් වූවකි. ධාරණය කාර්යයද පහසු කරුණක් නොවීය. සූත්‍ර පිටකය පැවරූ භාණකවරුන් ලෙස මෙම තෙරවරුන් වගකීම් දැරූ අතර පසු කලෙක ගුරුකුල බිහිවුණි.

01. දීඝනිකාය - ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පිරිස
02. මජ්ඣිමනිකාය - සැරියුත් තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පිරිස
03. සංයුක්තනිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පිරිස
04. අංගුත්තරනිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පිරිස
05. ඛුද්දකනිකාය - පොදුවේ සියලු භික්ෂූන් වෙත වගකීම් පැවරීය

''එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි. පුට්ඨො පුට්ඨො ආයස්මා ආනන්දො විස්සජ්ජෙසි.''[14] සූත්‍ර දේශනාවන් සම්බන්ධ නිදානය, ස්ථානය, ධර්මය ආදි වශයෙන් අසන ලද සියලු කරුණුවලට ආනන්ද තෙරණුවෝ පිළිතුරු සැපයූහ.

''සුණාතු මෙ සංඝො යදිසංඝස්ස පත්තකල්ලං අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං''[15] ඇවැත්නි සංඝයා මාගේ වචනය අසත්වා. සංඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම උපාලි ආයුෂ්මතුන්ගෙන් විනය පිළිවිසින්නෙමි'යි විනය විනයධර උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පිරිස විසින් පරාජිකා පාලි, පාචිත්තිය පාලි, මහාවග්ගපාලි, චුල්ලවග්ගපාලි, පරිවාරපාලි වශයෙන් සංගෘහිතව පරිවහනය කළහ.

"මුල පටන් ම ධර්මයේ පඤ්චක නිකායක් භාවිතා වී ඇති අයුරු අර්ථකථා ආදියෙන් මැනවින් හෙළිවෙයි. දීඝභාණක, මජ්ඣිම භාණක, සංයුක්ත භාණක, අංගුත්තර භාණක, ඛුද්දක භාණක යනුවෙන් ආදීයේ සිට ම පඤ්චක නිකාය වෙන් වෙන් වශයෙන් ආචාර්ය පරම්පරාව විසින් හැදෑරූ බව පෙනේ. ජාතක භාණක, ධම්මපද භාණක ආදි වශයෙන් ඛුද්දක නිකාය එක් එක් කොටස් ප්‍රගුණ කළ ආචාර්යවරුන් ද සිටි බව අර්ථකථා ආදියෙන් පැහැදිලි වේ. විනය සංගායනාවට අනතුරුව ධර්ම සංගායනාව ආරම්භ කොට බ්‍රහ්මජාල සූත්‍රයෙහි පටන් ඒ ඒ සූත්‍රයන් සංගායනාවට නගා පසු දීඝනිකායා දි නිකාය පහකට එය බෙදන ලදී."[16]

**ධර්ම ශාස්ත්‍රීය අධ්‍යනයෙහි ව්‍යාප්තිය**

ප්‍රථම ධර්ම සංගීතියෙන් පැවරුණු වගකීම අනුව මහතෙරවරුන්ගේ (භාණක) ධාරණය විශිෂ්ට වූවකි. කිසිදු ලිඛිත ක්‍රමවේදයක් අනුගමනය නොකර වාචෝත්ගතභාවය මත ම පෙළදහම උදෙසූහ. පරිශීලනය කළහ.

"භාරතීය බෞද්ධ භික්ෂුවගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව මුල දී සංචාරක ධර්මදූත සේවාවෙන් ආරම්භ වී අවසානයේ දී ප්‍රබල දේශ දේශාන්තරයන්හි පතළ කිත් යසස් ඇති විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන ආයතන දක්වා පුළුල් වූයේය. විධිමත් පරිපාලනයකින් ගැඹුර ශාස්ත්‍රීය අධ්‍යාපනයකින් හා පුළුල් විෂය මාලාවකින් සැදුම්ලත් ඉහත සඳහන් විශ්වවිද්‍යාල පිළිබඳ තොරතුරු අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේ ශාස්ත්‍රීය අංශයෙන් සැලසූ සේවාව අපමණ ය. දේශිය හා විදේශිය ශිෂ්‍යයන් සඳහා විවෘතව පැවති මෙම ආයතන ඉහළම මට්ටමේ ශාස්ත්‍රායතන වූ බවට කිසිදු සැකයක් නොමැත. ආචාර්ය නාගර්ජුන, අරියදේව, ශාන්තරක්ෂිත, කමලශීල ආදි ආචාර්යවරුන් විසින් රචනා කළ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයෝ මීට සාධකයෝ වෙති. මොවුහු සමකාලීන දාර්ශනික අංගවලින් බුදුසමය වෙත එළඹි සියලු දාර්ශනික තර්ජන සමථයකට පත් කොට බුදුදහමේ නිර්මලත්වය ඇති කළහ."[17]

නාලන්දා විශ්වවිද්‍යාලය ආචාර්ය මණ්ඩලය භාෂා ශාස්ත්‍රයන්හි පරතෙරට පත් පඬිවරු එක්දහස් පන්සිය දහසයකින් යුක්ත වූහ. සූත්‍ර



හා ශාස්ත්‍ර නම් කොටස් විස්සක් ඉගැන්විය හැකි ගුරුවරු දහසක් ද විෂය කොටස් තිහක් ඉගැන්විය හැකි ආචාර්යවරු පන්සියයක් ද විෂය කොටස් පනහක් ඉගැන්විය හැකි ගුරුවරු දහයක් ද මෙහි වැඩවිසූහ.[18]

නාලන්දා ප්‍රවේශ විභාගයට දේශීය සිසුන් පෙනී සිටියහ. ඔවුන්ගේ සෑම දස දෙනෙකුගෙන් තිදෙනෙකු පමණක් තෝරා ගැනුණි. විදේශීය සිසුන් සියයට අසූවක් මෙම පරීක්ෂණයෙන් අසමත් වූහ. මෙමගින් මතකය කෙතරම් ප්‍රමුඛ වූවාද යන්න ගම්‍ය වේ. බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායෙහි මතක ශක්තිය හැමවිටෙකම ප්‍රධාන වේ. ගුරු සිසු දෙපිරිස කෙරෙහි විශිෂ්ට ස්මරණතාව අධ්‍යයන කාර්යයෙහි ප්‍රමුඛ සාධකයක් වූයේය.

මෙම ඉගැන්වීම් ක්‍රමවේද සලකා බැලුව ද ස්මරණය වැදගත් සාධකයකි. දේශනයේ දී ආචාර්යවරයා විෂය කරුණු කියන කල්හි ශිෂ්‍යයා වැදගත් කරුණු සටහන් කර ගැනීම හා පහසු හා දන්නා කරුණු මතක තබා ගැනීම, විවිධ මාතෘකා ඔස්සේ විවාද විචාර විමර්ශනය සාකච්ඡා ස්වකීය ආචාර්යවරයා සමග කේවල හෝ කණ්ඩායම් සාකච්ඡා ඉගෙනුම ස්මෘතිය මුල් කර ගත් ක්‍රියාවලියකි.

"එකල ඉන්දියාවේ පැවති උසස් අධ්‍යාපන ආයතන අතුරින් විශ්වවිද්‍යාලය ප්‍රවේශය පරීක්ෂණය බෙහෙවින් ම තියුණු වූයේ නාලන්දාවෙහිය. මෙයට ඇතුළත් වීමට ආ ශිෂ්‍ය සංඛ්‍යාව අධික වීම මීට හේතු වූවා විය හැකිය. ඇතුළත් වීමට මූලික හා ද්විතියික දැනීම සම්පූර්ණ විය යුතුය. මාධ්‍ය වශයෙන් සංස්කෘත භාෂාව සැලකිණි. ව්‍යාකරණාවබෝධය වැදගත් විය. සංස්කෘත භාෂාව, වාග්විද්‍යාව, තර්ක ශාස්ත්‍රය. අභිධර්ම කෝෂය, ජාතකමාලාව ආදිය පිළිබඳ මනා පරිචයක් අවශ්‍ය විය. චතුර්වේදය, උපනිෂද් දර්ශනය, දර්ශන විද්‍යාව ආදිය පිළිබඳ සාමාන්‍ය ඥානය අපේක්ෂිත වූයේ ය. ශාස්ත්‍රීය මට්ටමින් මෙවැනි ප්‍රවේශික දැනුමක් අපේක්ෂා කළ අතර සෑම ශිෂ්‍යයෙකු ම යහපත් චරිතයකින් සැදුම් ලැබීම ද අත්‍යවශ්‍ය විය."[19]

දේශනයේදී ආචාර්යවරයා විෂය කරුණු කියන කල්හි ශිෂ්‍යා වැදගත් කරුණු සටහන් කර ගැනීම, පහසු හා දන්නා කරුණු මතක තබා ගැනීම සිදු කරයි.

## විවිධ මාතෘකා ඔස්සේ විවාද විචාර විමර්ශනය

ස්වකීය ආචාර්යවරයා සමග කේවල හෝ කණ්ඩායම් සාකච්ඡා ඉගෙනුම සමස්ත ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම ස්මෘතිය මුල් කර ගත් ක්‍රියාවලියකි.

වික්‍රමශිලා විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ දී ප්‍රවේශ පරීක්ෂණයකට සහභාගී වීම අනිවාර්ය වේ. විද්‍යා මණ්ඩප නමින් පැවතුණ අතර එහි වගකීම භාර ද්වාර පණ්ඩිත නම් භික්ෂුවක් පරීක්ෂණ පැවැත්වීය.[20]

මුල්කාලයේ භික්ෂූන් වහන්සේලාට පොත්පත්, ලිඛිත මූලාශ්‍රය පරිශීලනයක් නොවුණි. එහෙයින් ධර්ම විනය කටපාඩමින් පවත්වාගෙන යාම, ස්මරණය, සජ්ඣායනය අධ්‍යයන ක්‍රමවේද විය. උගත් දේ මතක තබා ගැනීම පමණක් නොව මෙමගින් ධර්ම සාහිත්‍යයක් සුරක්ෂිත කර ගැනීමේ වගකීම ද උන්වහන්සේලා වෙත පැවරුණු බැවින් වාචනා මාර්ගයෙන් ස්මෘතිමත්භාවය වැදගත්කොට සැලකුණි. එබැවින් භාණක නමින් සජ්ඣායක භික්ෂු පිරිසක් එහි යුහුසුලු වූහ. මෙය මහත් පරෙස්සමින් සිදු කළ යුක්තක් විය. ධර්මය නිවැරදිව ඉගැන්වීමත් වාචෝත්ගත කිරීමත් ධාරණය කර ගැනීමත් ස්මෘතිමත්භාවයත් අවශ්‍ය වූයේ සත්‍ය වූ බුද්ධ දේශනාව චිරස්ථායි විය යුතු බැවිනි.

## ධර්මාවබෝධයෙහිලා ධර්මාධ්‍යයන උපයුක්තතාව

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ විසින් දේශිත ධර්මය 'පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූ' ප්‍රත්‍යක්ෂයෙන් නුවණැත්තන් විසින් අවබෝධ කළ යුතුය, යන නිර්දේශය මත උන්වහන්සේද 'විඤ්ඤූපුරිස' භාවය අපේක්ෂා කළහ. දේශිත ධර්මය පිළිබඳ නැවත සිතා බැලිය හැකි විඤ්ඤූ පුරුෂයන් දහම විමසනු ලබයි. එහි ලක්ෂණ තුනක් දක්වා තිබේ. එනම්,

01. අසඨයො - කපටි නොවන බවයත දැනගනු කැමතිවම දහම් ඇසිය යුතු බව මෙයින් ප්‍රකාශිතය.



02. අමායාවී - විවෘත මනසකින් යුක්ත බවයත අව්‍යාජ පෙළඹීමක් අවශ්‍ය බව මෙයින් අවධාරණය කෙරේ.

03. උජුජාතිකො - ඍජු බවෙන් යුක්තවීමයි. දෙගිඩියාවකින් තොරවීම වේ.

''තෙ ච භික්ඛු අට්ඨිකත්වා මනසිකත්වා සබ්බ චෙතසො සමන්නාහරිත්වා ඔහිත සොතො ධම්මං සුණාති.''[21] ශිෂ්‍යයා අර්ථවත් ව මෙනෙහි කර මුලු සිත ම එයට යොමු කර සවන්දීමෙන් ධර්මය උගනී.

බුදුහු ප්‍රථම ශ්‍රාවක පිරිස අමතා ගම් දනව්හි සැරිසරා ධර්මය ඉතා පිරිසිදු ලෙස කැපවීමෙන් ව්‍යාප්ත කරන ලෙස උපදෙස් දුන්හ. එහිදී අනුගාමිකයාට ප්‍රකාශ කරන ධර්ම පණිවුඩයෙහිත

01. ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං - මුල මැද අග යහපත් ලෙස ප්‍රකාශ කරන්න.
02. සාත්ථං - අර්ථ මැනවින් පැහැදිලි කරන්න.
03. සබ්‍යඤ්ජනං - අක්ෂර පාරිශුද්ධිය සුරකින්න.
04. කේවලපරිපුණ්ණං - පිරිපුන් අදහස් දක්වන්න.
05. පරිසුද්ධං[22] - පිරිසිදු අවබෝධයක් ඇති කරන්න.

ධර්ම සන්නිවේදනය පිළිබඳව දක්වන ලද මෙම අදහස් මගින් බුදුරජාණන් වහන්සේ භික්ෂුව තුළ ධර්ම විනය පිළිබඳ විශාරද භාවය පිරිසිදු ධාරණ ශක්තිය අවශ්‍යතාවක් ලෙස අවධාරණය කර ඇත.

පපඤ්චසූදනියේ දැක්වෙන පරිදි බුද්ධ කාලයේ සිට ම ධර්මය හැදෑරීම අනුමත ය. එය 'පරියාපුණාති'[23] ලෙස දක්වා ඇත. එය ලෝකෝත්තර මාර්ග ඵල පරමාර්ථයෙන් කළ යුතුය. නැතහොත් පොදු පරමාර්ථයෙන් පුළුල් අරමුණකින් යුක්ත විය යුතුය. ''ඉධෙකච්චෙ මොඝ පුරිසං ධම්මං පරියාපුණන්ති. සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භූතධම්මං, වේදල්ලං.'' මෙහි 'පරියාපුණන්ති' යනුවෙන් එය දක්වා ඇත. එසේම ''එවං හි පරියාපුණතොහි බුද්ධ වචනං අපරියාපුණිත්වා නිද්දෙකමනංවරතරං'' පෞද්ගලික අර්ථ ලාභය සඳහා නොහැදෑරිය යුතුය.[24]

ධර්ම විනය අධ්‍යයනය සඳහා කාණ්ඩ කර ගැනීමක් (නවංග සත්ථු සාසනය) නැතහොත් වර්ගීකරණයක් මෙමගින් දැක්වේ. ''බහුම්පි චෙ සහිතං භාසමානො''[25] බුද්ධ දේශිත ධර්ම විනය මෙහි 'සහිත' ශබ්දයෙන් කියවේ. ''සහිතන්ති තෙපිටකස්සෙ බුද්ධවචනස්සෙතං නාම'' යනුවෙන් බුද්ධඝෝෂ අටුවාචාර්යයෝ මෙයට අරුත් දැක්වූහ. ත්‍රිපිටක සාහිත්‍යයක් ලෙස හැදෑරීම යුතු නම් එය මතක තබා ගැනීමේ උපක්‍රමයක් ද වනු ඇත.

සිව්පිළිසිඹියා ධර්ම අතුරෙන් ප්‍රතිසම්භිදාව හෙවත් පටිභාන යන කරුණු අටකින් හෙබි ප්‍රඥා ගුණ රාශියකි. එනම්, සද්ධම්මපකාසිනියෙහි පුබ්බයෝග, බාහුසච්ච, දෙසභාග, ආගම, පටිපුච්ඡා, අධිගම, ගරුසන්නිස්සය, මිත්තසම්පත්ති ආදි ලක්ෂණ අටක් වශයෙන් දැක්වේ. මෙයින් බොහොමයක් කරුණු පර්යාප්ති ශාසනයෙහි ලක්ෂණයන් ය. අටුවාවේ පැහැදිලි කිරීම අනුව බාහුසච්ච හෙවත් බහුශ්‍රැතභාවය යනු ඇසූ පිරූ තැන්හි පවත්නා පිරිසිදු දැනුම අවබෝධය වේ. එසේම දෙසභාස යන්නෙන් සුවිශද වූ භාෂාන්තර ඥානයක් අර්ථ කථනය කෙරේ. එනම්, 'එකසත වොහාර' සියයක් පිළිබඳ භාෂාවන්හි වූ ධාරණය යි. එහි විශේෂයකිත එනම් 'දෙසභාසා නාම එකවොහාර කුසලතා විසෙසෙන පන මාගධිකො කොසල්ලං' මාගධී භාෂාවෙහි හසල දැනුමැති නිපුණයෙකු වීම යි. මෙමගින් පැහැදිලි වන්නේ ප්‍රතිසම්භිදා ප්‍රාප්තභාවය යනු ධර්මය පිළිබඳ පමණකුදු නොව භාෂාවන්හි ද නිරුක්ති කථනයෙහි ප්‍රාමාණික වූ විශාරද භාවය වේ.

පිරිවාන හෙවත් පිරිවහනය යනු කටපාඩම් කිරීමකි. පිරිවානා පොත සම්පූර්ණයෙන් ම පාඩම් නොකළ හැකි වූවත් පැවිදි නොකරන ලෙස පුරාණ කතිකාවත්හි නිගමනය විය. අභිධර්ම විශාරදයෙකු වූ පස්වන කසුප් රජතුමා පිහිට වූ අභයගිරි සෙල්ලිපියෙහි 'සතර බණවර පිතිසේ නොකළ වුන් පැවිදි නොකළ යුතුයැ'යි' නියෝග කර තිබුණේ ය. මේ නියාම චතුභාණවාරපාලිය පිරුවානා පොත යන නම ලැබීය. වෛදිකයන් මන්ත්‍ර හා ධාරණී ස්මෘතියෙන් ම දැරිය යුතුයත යනු ඔවුන්ගේ පිළිගැනීමයි. එසේ නොවී නම් ලැබෙන ගුණය නිසි සේ නොලැබෙයි. පිරිත වුවද ධාරණයෙන් දේශන කළහොත් අවධානය එයට ම යෙදෙන නිසා වඩා යහපත් විය යුතු ය.[26]



බෞද්ධ අධ්‍යාපන ක්‍රමය අනුව ශ්‍රවණ මාධ්‍යය ඔස්සේ ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම අනුක්‍රමික පියවර කිහිපයකින් යුක්තව සිදුවන්නකි. ශ්‍රවණයේ සිට වටහා ගැනීම දක්වා එන පියවර කිහිපයකි.

01. අවධානය යොමු කිරීම - ඔහිතසොතො

02. ඇසීම - සුණාති

03. ප්‍රශ්න කිරීම - පටිපුච්ඡති

04. දැරීම - ධාරෙති

05. අර්ථ පරීක්ෂා කිරීම - අත්ථං උපපරික්ඛති[27]

ඉගෙනුම යනු හුදෙක් යාන්ත්‍රික මතකය නොවන බව මෙම පියවර පරීක්ෂා කිරීමේදී පැහැදිලි ය. ඉගෙනීම් ඉගැන්වීම් වශයෙන් හෝ සාමාන්‍ය අදහස් හුවමාරු කර ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අටක් දූතෙය්‍ය සූත්‍රයෙහි සඳහන් වේ.

01. සොතා ච හොති - භාෂාත්මක හැකියාවන් සහිත බව

02. සංවෙතා ච හොති - අන්‍යන්ට ඇහුම්කන් දීමේ හැකියාව

03. උල්ලහෙතාච හොති - හොඳින් අවබෝධ කර ගැනීමේ හැකියාව

04. ධාරෙතා ච හොති - ධාරණය කර ගැනීමේ හැකියාව

05. විඤ්ඤාඤා ච හොති - දැන ගැනීමේ හැකියාව

06. කුසලොච සහිත සහිතස්ස - දක්ෂතා සහිත අයෙකු වීම

07. විඤ්ඤාපෙතා ච හොත්[28] - දැනගත් දේ කියාදීමේ හැකියාව

08. නො ච කලහකාරො - කල කෝලාහල කරන්නෙකු නොවීම

බුද්ධ දේශනාව ත්‍රිවිධාකාරයෙන් භික්ෂුව ශික්ෂණය විය යුතුය'යි දක්වයි. එනම්, පරිපූර්ණ ශාස්ත්‍රීය ශික්ෂණය නම් වූ පර්යාප්ති එළඹ සිටි සිහි නුවණින් මෙනෙහි කිරීම, භාවිතය සහිත පටිපත්ති සහ සත්‍යය යථාවබෝධයෙන් අනිත්‍යාදි වශයෙන් විශේෂයෙන් දැකීම,

ප්‍රතිබද්ධ පටිවේද යනුයි. මෙම අවස්ථා තුන සීලරතන, ඒ. (2008) පහත සඳහන් පරිදි විග්‍රහයක යෙදේ.

''මනාව උගත් තැනැත්තෝ අවබෝධ කර ගනී. ධාරණය කර ගනී. වර්ධනය කර ගනී. තථාගත ධර්ම විනය සෛද්ධාන්තික වශයෙන් මනාව වටහා ගනී. මනාව උගත් හෙතෙම තමන් උගත් ධාරණය කරගත් කරුණු පරික්ෂා කරයි. සියලු අර්ථව්‍යංජන සහිතව දැනගනී. තමා උගත් ආකාරයට අනුව 'යථාසුතං' 'යථාපරියත්තං' ඇසූ ආකාරයට අනුව ඒවාට තම සිත යොමු කරයි. ඒවා තම සිතෙහි පුරුද්දක් ලෙස නිබඳව ප්‍රගුණ කරයි. ස්මෘතියෙන් යුතුව සමීක්ෂාවෙන් යුතුව මානසික ඒකාග්‍රතාවයක අදාළ අරමුණක සිත පිහිටුවාලයි. ඒ පිළිබඳව නිරන්තරයෙන් භාවනානුයෝගී වෙමින් මනස තුළ යථාර්ථාවබෝධය ලබන විසුද්ධිය අත්පත් කර ගනී.''[29]

ගමගේ, ඒ. කේ. (2014) විමර්ශනය කළ පරිදි ''බුදුරජාණන් වහන්සේගේ දේශනා ශෛලියෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් වෙවචන (පර්යාය පද රැසකින් එකම ධර්ම කරුණ විස්තර කිරීම) බාහුල්‍යයයි. ධම්මපාල හිමියන් පෙන්වා දෙන ආකාරයට එකම ධර්ම කාරණය විවිධ වචනවලින් ප්‍රකාශ කිරීමෙහි පරමාර්ථය නම්ත වඩාත් පැහැදිලි අවබෝධයක් ශ්‍රාවකයා හට ලබා දීමයි. 'තදත්ථපටිබොධො සියා' එසේම විපිළිසර සිත් ඇත්තවුන්ට ද මෙම පර්යාය පදවල උපකාරයෙන් අර්ථය වටහා ගැනීමට හැකියාව ලබා දීමයි.''[30] භික්ෂු අධ්‍යාපන ක්‍රමවේදයන්හි මෙම සුවිශේෂී ක්‍රම අනුගමනය කළ බව විද්‍යාමාන වේ.

සමාලෝචනය

බෞද්ධ භික්ෂු අධ්‍යාපනයෙහි විෂයමාලාව අධ්‍යයන ක්‍රමවේද සහ පරමාර්ථ හා අරමුණු ඊට ම අනන්‍ය වේ. වර්ෂ දෙදහස් හයසියයක සක්‍රිය භාවිතයෙහි

''පභස්සරමිදං භික්ඛවේ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං''[31] සිත ප්‍රභාෂ්වරය සිතට ආගන්තුකව පැමිණෙන උපක්ලේශයන් මගින් සිත කිළිටි වේ. ඉගෙනුම අමතකවීම කෙරෙහි ක්ලේශයන් ඍණාත්මක බලපෑමක් කෙරේ. 'ධම්ම සොතං



සමාපන්නො' සතිය පෙරටු වූ සිත් යහපත් අරමුණෙහි වැඩීමෙන්, කෙලෙස්වලින් සිත බැහැරවීමෙන් ලැබෙන අව්‍යාසේඛ සුඛය වේ.

බෞද්ධ අධ්‍යාපනය භික්ෂු ජීවිතයේ පිළිගත් පිළිවෙත් මගින් ගොඩනැගෙන ආධ්‍යාත්මික අසහාය ශක්තීන් මගින් පෝෂණය වන්නකි. මානසික වශයෙන් ලබන්නා වූ උසස් විශිෂ්ටත්වය නිසා ම බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය වෙනත් කිසිදු ආගමික සම්ප්‍රදායක දක්නට නොමැති විශිෂ්ටාර්ථයන්ගෙන් යුක්ත වන්නේම ය.

''ශාරිපුත්‍රයන් වහන්සේ මෙහි යම් මහණෙනි-බහුශ්‍රැතවේද, ඇසූ දැය දරන්නේ වේද, ඇසූ දැය රැස් වූ තැනෙක වේද, යම් ඒ ධර්මයෝ මුල යහපත් වූ ද මැද යහපත් වූ ද අග යහපත් වූයේ වේද, අර්ථ සහිත ද ව්‍යඤ්ජන සහිත වූයේ ද කේවල පරිපූර්ණත්වය කොට පිළිසිඳ කොට අසන ලද්දා හු වචනයෙන් පුරුදු කරන ලද්දා හු සිතින් නැවත නැවත පරීක්ෂා කරන ලද්දා හු ප්‍රඥාවෙන් මනාව අවබෝධ කරන ලද්දා හු වෙද්ද, පෙර සප්ත අනුශයන් නැසීම පිණිස සිවුපිරිසකට පිරිමඩුලු දී ප්‍රබුද්ධ නොවු අතරක් නැතිව පවත්නා වූ පද ව්‍යඤ්ජනයෙන් යුක්තව ද දහම දෙසා ද ඇවැත් ශාරිපුත්‍රයන් වහන්සේ මෙවැනි මහානුභාවයෙන් යුක්තය හ.''[32]

බුදුසමය සිහිය, මතක තබා ගැනීම හෙවත් ධාරණය පිළිබඳව දක්වා ඇති අවධානය මෙමගින් පැහැදිලි වේ. ආගමික ඉතිහාසය පුරාම සැලකිය යුතු උත්සාහයක් ධර්ම සාහිත්‍යය කට පාඩමින් පවත්වා ගෙන යාම ගැන යොමු කොට ඇත. ආගමික ඥානය පරම්පරානුගතව පවත්වා ගෙන ආවේ වාචනා මාර්ගයෙන් බව අනාවරණය වේ. එහිදී ස්මෘතිමත් බව වඩාත් වැදගත් සාධකය වුණි. අධ්‍යාපනයේ දී ධාරණය ඉගෙනුම පිළිබඳ තක්සේරුවක් මිනුම් දර්ශකයකි. ඇගයීමක් බවට පත්ව ඇති බව මේ අනුව පිළිගත හැකිය.

''බුද්ධි වර්ධනය පමණක් අධ්‍යාපනය යනුවෙන් බුදුසමය අදහස් කරනු නොලබයි. පුද්ගලයාගේ හැසිරීමෙන් කුසලතා වර්ධනයත් පැවතිය යුතුය. බුද්ධි වර්ධනය ද (විජ්ජා) මනා හැසිරීම ද (චරණ) කුසලතා වර්ධනය ද (කොසල) යන අංශ තුනෙහි ම සමන්විත පූර්ණ පුද්ගලයකු සමාජයට දායාද කිරීම අවශ්‍ය වෙයි. බුදුසමය අවධාරණය

කරනු ලබන්නේ එබඳු ගති ස්වභාව පිළිබඳවය.''[33]

බුදුසමය තුළ ශික්ෂණය ලබන්නා වූ ගිහි - පැවිදි අනුගාමිකයාගේ ලෞකික ලෝකෝත්තර අභිමතාර්ථයන් සාධනයෙහිලා වර්තමාන අධ්‍යාපනයෙහි සුවිශේෂී අරමුණු පදනම් වන ප්‍රජානන, ආවේදන, මනෝචාලක ක්ෂෙත්‍රයන් හි සන්දර්භය ඉක්මවා ලූ අතිවිශිෂ්ටත්වයක් යුක්ත වන්නේ ය. අධ්‍යාපන අරමුණු පිළිබඳ පෙර දැක්වෙන විවරණ කදිම නිදසුනකි.

### ආන්තික සටහන්

1. චුල්ලවග්ගපාළි ii (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 368.
2. මජ්ඣිමනිකාය iii, ආනන්ද භද්දේකරත්ත සූත්‍රය (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 408.
3. පඤ්ඤාලෝක, එම්. (2002) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10. පි. 93.
4. අංගුත්තරනිකාය V, පඨම නාථකරණ සූත්‍රය (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල. පි. 44.
5. මජ්ඣිමනිකාය ii, කීටාගිරි සූත්‍රය ii, (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 230.
6. ධම්මකිත්ති, ඩබ්. (2006) බුද්ධ දේශනා විලාසය, සරත්වතී ප්‍රකාශන දිවුලපිටිය. පි. 54.
7. අදිකාරම්, ඊ. ඩබ්. (පු.මු.2013) පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 230.
8. පඤ්ඤාලෝක, එම්. (2002) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10. පි. 97.
9. රාහුල, ඩබ්. (2006) ලක්දිව බුදුසමයේ ඉතිහාසය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10. පි. 164-165.
10. වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නං අනුධම්මචාරිනෝ සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දේසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති



උත්තානි කරිස්සන්ති උප්පන්නුප්පන්නං පරප්පවාදං සහ ධම්මේන සුග්ගහිතං නිග්ගහෙත්වා සප්පටිහාරියං ධම්මං දේසෙස්සන්ති

11. සමන්තපාසාදිකා, (ප්‍රථම භාගය) හේවාවිතාරණ එස් මුද්‍රණාලය, කොළඹ. පි. 16.
12. පඤ්ඤාසාර, එස්. (2011), ධර්ම ප්‍රභා, සංස්: චන්දරතන, එම්. ධර්ම සංගායනා හා එයින් සිදුවූ ශාසනික විප්ලවය, විමල විහාර පදනම ප්‍රකාශන, නාවල. පි. 344.
13. චුල්ලවග්ගපාලි ii, පඤ්චසතිකඛන්ධකයත (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 333.
14. ..එම...පි. 554.
15. ...එම...පි. 556.
16. සමන්තපාසාදිකාත (1938), සංස්: හේවාවිතාරණ, එස්. (ප්‍රථම භාගය) සෝමාවතී ග්‍රන්ථ භාරය, කොළඹ. පි. 16.
17. සෝමිස්සර, එම්. (1964), බුද්ධ ධර්මය, ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ 11. පි. 201.
18. පඤ්ඤාසාර, එස්. (2011), ධර්ම ප්‍රභා, සංස්: චන්දරතන, එම්. ධර්ම සංගායනා හා එයින් සිදුවූ ශාසනික විප්ලවය, විමල විහාර පදනම ප්‍රකාශන, නාවල. පි. 343.
19. බුද්ධදත්ත, පි. (1968), බෞද්ධාචාර්යයෝ, ප්‍රකාශක: රත්නසිරි, කේ. එම්. අම්බලන්ගොඩ. පි. 68.
20. විජේබණ්ඩාර, සී. මොරටුවගම, එච්. එම්. (1995), බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම සහ වංශකථාව, සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ 2. පි. 222.
21. බාපට්, පී. වී. දෙදහස් පන්සිය වසරක බොදු සමය, කතෘ ප්‍රකාශන, කොළඹ. පි. 244.
22. මජ්ඣිමනිකාය ii, වෙචනස්ස සූත්‍රය, (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 400.
23. ''එතු විඤ්ඤූ පුරිසොත අසඨො අමායාවී උජුජාතිකො අහමනුස්සාමි අහං ධම්මං දෙසෙමි. යථානු සිට්ඨං තථා පටිපජ්ජමානො න චිරස්සේව සාමඤ්ඤේව ඤස්සඤ් සාමං දක්ඛිති''
24. සංයුත්ත නිකාය i, සාරිපුත්‍ර සූත්‍රය, (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 338.
25. මහාවග්ගපාළි i, (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 42.

26. පපඤ්චසූදනී, අලගද්දූපම සුත්ත වණ්ණනාන (1927) හේවාවිතාරණ මුද්‍රණය, (දෙවන භාගය) කොළඹ. පි.89.

27. පිරුවානා පොත් වහන්සේ, (1994), සංස්: රාහුල, ඒ. වනරතන, කේ. ප්‍රස්තාවනාව, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම, කොළඹ. පි. 18-19.

28. සුත්තනිපාතය, (2005), ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

29. අංගුත්තරනිකාය V, (අට්ඨක නිපාතය), දූතෙය්‍ය සූත්‍රය, (2005), ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 79.

30. සීලරතන, ඒ. (2008), බෞද්ධ චින්තනයෙන් පිළිබිඹුවන අධ්‍යාපන දර්ශනය, කතෘ ප්‍රකාශන, කැලණිය. පි. 164.

31. මගේ, ඒ. කේ. (2014), ථෙරවාදී අර්ථකථන සිද්ධාන්ත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10. පි. 208.

32. ඛුද්දකනිකාය, උදාන පාලි, (2005), ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 44.

33.. දීඝනිකාය i, සාමඤ්ඤඵල සූත්‍රය, (2005) ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 122. "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු බහුස්සුතො හොති. සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදි කල්‍යාණං, මජ්ඣෙ කල්‍යාණං, පරියොසාන කල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපස්ස ධම්මා බහුස්සුතා හොන්ති. ධතා, වචසා, පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුපටිවිද්ධා සො චතස්සන්තං පරිසානං ධම්මං දෙසෙති. පරිමණ්ඩලේහි පදබ්‍යඤ්ජනේහි අප්පබද්ධෙ අනුසමුහසාතාය එවරූපෙන.........."